මෙම සැත්කමින් පසුවද ඔබට වෙනදා මෙන් සාර්ථකව ලිංගිකව එකතු විය හැකිය

මෙම සැත්කම නිසා ඔබට බර වැඩ කිරීමට ඇති හැකියාවේ කිසිදු අඩුවක් සිදු නොවේ

**සැත්කමින් පසු ඇතිවන ඕනෑම අපහසු තත්ත්වයකදී ළඟම ඇති රෝහලෙන්/සෞඛ්‍ය මධ්‍යස්ථානයෙන් උපදෙස් ලබා ගන්න**

## වැදගත්

- සැත්කමින් මාස 03 කට පසු ශුක්‍ර තරල පරීක්ෂණයක් සිදු කරවා ගැනීම වඩාත් සුදුසුය

## සාර්ථකත්වය

- 99% ක ටත් වඩා වැඩියි

නැවත නැවත පවුල් සැලසුම් ක්‍රම ලබා ගැනීම අවශ්‍ය නොවන නිසා, පුරුෂ ස්ථිර සැත්කමින් පසු ඔබට සැහැල්ලු ප්‍රීතිමත් පවුල් දිවියකට මඟපාදා ගත හැකිය

**වැඩිදුර උපදෙස් සඳහා හමුවන්න**

- සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීන්
- වෛද්‍ය නිළධාරීන්
- ලියාපදිංචි වෛද්‍ය නිළධාරීන්
- මහජන සෞඛ්‍ය හෙද සොහොයුරියන්
- පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනියන්

**සුවසැරිය ✆ 1999**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ, පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ සහ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ ප්‍රකාශනයකි

නිසි කල රිසි ලෙස දරු සම්පත

**ප්‍රීතිමත් යුග දිවියක් උදෙසා...**




# පුරුෂ ස්ථිර සැත්කම

(වාසෙක්ටමි)

## පුරුෂ ස්ථිර සැත්කම (වාසෙක්ටමි) යනු කුමක්ද?

- මෙහිදී පුරුෂයෙකුගේ වෘෂණ කෝෂවල සිට ශිෂ්ණය (පුරුෂ ලිංගය) දක්වා ශුක්‍රාණු (පුරුෂ බීජ) ගෙන යන ශුක්‍ර නාලය අවහිර කරනු ලබයි.
- මෙම ක්‍රමයේදී වෘෂණ කෝෂයේ කුඩා සැත්කමක් සිදු කරයි
- සැත්කම සිදු කර පැය කිහිපයකින් ඔබට රෝහලෙන් පිටව යා හැකිය
- සැත්කමට ගත වන්නේ මිනිත්තු 10-15 ක් පමණි




## පුරුෂ ස්ථිර සැත්කම සුදුසු කාහටද?

- පවුලකට අවශ්‍ය තරම් දරුවන් ගණනක් ලබා සිටී නම් මෙම ක්‍රමය සුදුසුය.

## පුරුෂ ස්ථිර සැත්කම සඳහා තිබිය යුතු අවම සුදුසුකම්

- දරුවන් දෙදෙනකු වත් සිටීම
- දෙවන දරුවාගේ වයස අවුරුදු දෙකක් වත් වීම
- සහකාරියගේ වයස අවුරුදු 26 කට වඩා වැඩිවීම



## සැලකිය යුතුයි

**සැත්කමින් පසු .....**

- දින දෙකක්වත් ගතවන තුරු බර වැඩ කිරීමෙන් වැළකී සිටීම සුදුසුය
- දින 2-3 තදින් ආවරණයවූ යට ඇඳුමක් භාවිතා කළ යුතුය
- දින 2-3 යනතුරු ලිංගිකව එක්වීමෙන් වැළකී සිටිය යුතුය
- මාස 3 ක් යනතුරු රබර් කොපු (කොන්ඩම්) හෝ වෙනත් විශ්වාසදායී පවුල් සැලසුම් ක්‍රමයක් භාවිතා කළ යුතුය (මෙයට හේතුව මාස තුනක් පමණ යනතුරු ශුක්‍ර තරලයේ  ශුක්‍රාණු පැවතිය හැකි වීමයි)
- වෘෂණ කෝෂවල මඳ වේදනාවක් හෝ අපහසුතාවයක් ඇති වුවහොත්, එය දින 2-3 තුළ ක්‍රමයෙන් පහව යයි. සරල වේදනා නාශකයක් භාවිතයෙන් එම වේදනාව සමනය කරගත හැක

**මෙය ස්ථිර පවුල් සැලසුම් ක්‍රමයක් බැවින් නැවත දරුවන් ලබා ගැනීමට නොහැකිය**